# බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය

மேல் மாகாண ஆளுநர் பணிமனை

**GOVERNOR'S OFFICE - WESTERN PROVINCE**

අංක 204, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, බත්තරමුල්ල. | இல. 204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல. | No. 204, Denzil Kobbekaduwe Mawatha Battaramulla.


ඔබේ අංකය. / உமது இல. / Your Ref. } WPC/PSC/MNP/01/04/81

මගේ අංකය / எனது இல. / My Ref. } GOS/ADM/4/7/12

දිනය / திகதி / Date } 2020.06. 23

"ජනතා හිතවාදී විශිෂ්ටතම පළාත් රාජ්‍ය සේවාවක්" -" பொது மக்களுக்கு சிறந்த பொதுச் சேவை " -" People Friendly Excellent Public Service "

ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
ජනජය ගොඩනැගිල්ල
රාජගිරිය.

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බස්නාහිර පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය</u>**

උක්ත මැයෙන් යුතු ඔබේ සමාංක හා 2020.02.26 දිනැති ලිපිය හා බැඳේ.

ඒ අනුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බස්නාහිර පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය 2020.06.22 දාතමින් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බව කාරුණිකව දන්වමි.

අනුමත කරන ලද අදාළ පරිපාටියේ පිටපතක් මේ සමග ඔබ වෙත එවමි.

අ.කළේ: **පී. සෝමසිරි**
ආණ්ඩුකාර ලේකම්
බස්නාහිර පළාත

**ජේ.සී.ජයලාල්**
පරිපාලන නිලධාරි

**පිටපත:**

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප) - අනුමත කරන ලද යථෝක්ත පරිපාටියේ පිටපත් 02 ක් මේ සමග ඔබවෙත එවමි.

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

01. සම්බන්ධ වන ආයතන

| | | | |
|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව | - | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (බ.ප) |
| | යොමු අංකය | : | සමු/පා/5/6 (I වෙළුම) |
| | දිනය | : | 2019.11.20 |
| 1.2 | අමාත්‍යාංශය | - | සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප) |
| | යොමු අංකය | : | 1/9/1/39 (II වෙළුම) |
| | දිනය | : | 2019.12.02 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම | | |
| | යොමු අංකය | : | ඩී.එම්.එස්./ඩී/පොදු/11-2 |
| | දිනය | : | 2012.12.19 |
| 1.4 | ප්‍රධාන ලේකම් (බ.ප)ගේ නිර්දේශය | | |
| | යොමු අංකය | : | CSWP/PTR/9-3/FI/1-5 |
| | දිනය | : | 2019.12.18 |
| 1.5 | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | | |
| | යොමු අංකය | : | |
| | දිනය | : | |
| 1.6 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය | | |
| | යොමු අංකය | : | |
| | දිනය | : | |
| 1.7 | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය | | |
| | යොමු අංකය | : | |
| | දිනය | : | |

02. පත්කිරීම් බලධාරියා - බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ක්‍රියාත්මක වන දිනය - ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

03. සේවා ගණය පිළිබඳ විස්තර -

3.1 සේවා ගණය - තෘතියික

3.2 ශ්‍රේණි - විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය

අනුමත තනතුරු සංඛ්‍යාවට සීමා වන පරිදි අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රියාවලියක් මගින් බඳවා ගනු ලබන ජ්‍යෙෂ්ඨ, විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක/ සුසාධ්‍යකාරක/ උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරු විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලනමය/ පිරිස් කළමනාකරණ කාර්යයන් පැවරෙන නිලධර ගණයකි.

3.4 කාර්යයන් පැවරීම -

සේවයේ අවශ්‍යතාවය මත සමුපකාර සමිතිවලට අදාළ වන්නා වූ පනත් හා ප්‍රඥප්තිවලින් පවරා ඇති ව්‍යවස්ථාපිත රාජකාරි හා ඊට අදාළ අධීක්ෂණ කටයුතු දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරේ ස්වභාවය - ස්ථිර ,විශ්‍රාම වැටුප් සහිත ය.

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය - MN 7-2016 (රා.ප.ච.03/2016 අනුව)

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය: GOS/ADM/4/7/12
දිනය : 2020.06.22

5.2 වැටුප් පරිමාණය - රු.41,580–11x755–18x1030-68,425/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| විශේෂ | පියවර 04 | 43,845/- |

06. සේවා ගණයට අයත් තනතුරු /තනතුර

6.1 අනුමත තනතුරු නාම ,අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් | |
|---|---|---|---|---|
| සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරි | විශේෂ | 07 | i. | සමුපකාර සමිති ලියාපදිංචි කරවා සමිති පිළිබඳ ව්‍යවස්ථාපිත කටයුතු කිරීම. |
| | | | ii. | සමුපකාර සමිතිවල අධීක්ෂණ කටයුතු කිරීම. |
| | | | iii. | වාර්ෂික විගණන සැළැස්ම පිළියෙල කිරීම. |
| | | | iv. | සමුපකාර සමිතිවල විභාග විමර්ශන කටයුතු පරීක්ෂා කිරීම. |
| | | | v. | සමුපකාර සමිතිවල ලියාපදිංචිය අවලංගු කිරීම, නිර්දේශ ලබා දීම, ඈවරකර ගිණුම වසා දැමීම |
| | | | vi. | නීති රෙගුලාසි බලාත්මක කිරීම |
| | | | vii. | සමුපකාර සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය කිරීම. |
| | | | viii. | දුර්වල සමුපකාර සමිති හඳුනාගෙන ඒවා නගා සිටුවීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම. |
| | | | ix. | දෙපාර්තමේන්තුව විසින් පළාතේ ක්‍රියාත්මක කරනු ලබන විවිධ සංවර්ධන වැඩසටහන් අධීක්ෂණය කිරීම |
| | | | x. | සමුපකාර ව්‍යාපාරයට අදාළ අධ්‍යාපනික හා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම. |
| | | | xi. | නෛතික ගැටළු සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/4/7/12
දිනය : 2020.06.22

07. බඳවාගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | - |
| කුසලතා | 100% |

7.2 විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය

7.4.2 සුදුසුකම්

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ

7.4.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.3 පළපුරුද්ද : බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන නිලධාරි තනතුරේ I වන ශ්‍රේණියේ වසර 05 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ උසස් වීමේ දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරතිබීම.

7.4.2.4 කායික සුදුසුකම් : තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය

7.4.2.5 වෙනත් : තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු අතර යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

7.4.3 වයස : අදාළ නොවේ.

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය

7.4.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ

7.4.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.4.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : ලකුණු ලබා දීමක් සිදු නොකරන අතර මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරනු ලැබේ.

7.4.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධාරියා : පත්කිරීම් බලධාරියා

7.4.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක සේවා පළපුරුද්ද | 60 | ලකුණු ලබා ගැනීමේ කුසලතා අනුපිළිවෙල අනුව උපරිම ලකුණු ලබා ගන්නා අයගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ |
| සේවා නිපුණතාවය | 25 | |
| රහස්‍යතා වාර්තා | 10 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | 05 | |

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර පිළිබඳ විස්තර ඇමුණුම 01 හි දැක්වේ.

7.4.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධාරියා : පත්කිරීම් බලධාරියා

7.4.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අභ්‍යන්තර අයදුම්පත් කැඳවීමේ නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/4/7/12
දිනය : 2020.06.22

සංලක්ෂ්‍යය : මෙම පරිපාටිය අනුමත වීමෙන් පසු පළමු බඳවා ගැනීමේ අවස්ථාවේ දී , සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරි තනතුරේ වැඩ බැලීමට විධිමත් ව පත් කර ඇති නිලධාරීන්, බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2013.07.03 දිනැති ව අනුමත කර ඇති පරිපාටියේ අංක 7.4.4.3 යටතේ ජ්‍යෙෂ්ඨත්වය මත රහස්‍ය වාර්තා පදනම් කරගෙන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් පත් කිරීම සිදු කරනු ලැබේ.

08. කාර්යක්ෂමතා කඩඉම් : අදාළ නොවේ

09. භාෂා ප්‍රවීණතාවය : අදාළ නොවේ

10. ශ්‍රේණි උසස් කිරීම : අදාළ නොවේ

11. තනතුරුවලට පත්කිරීම : අදාළ නොවේ

12. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට නොහොත් නියෝගවලට ද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලට ද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

13. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ :

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : අදාළ නොවේ

15. මෙම පරිපාටියේ විධිවිධාන සලසා ඇති කරුණු සම්බන්ධ ව ගැටලු පැන නගින අවස්ථාවක දී හා / හෝ මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

16. අර්ථ නිරූපණ

සතුටුදායක සේවා කාලය

(i) පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත්වීම මගින් ද, ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

(ii) නිලධාරියා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එය ද, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර 03 ක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ II වැනි



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය: GOS/ADM/4/7/12
දිනය: 2020.06.22

කාණ්ඩයේ, වැරදි පිළිබඳ දෙවන උපලේඛණය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

සක්‍රිය සේවා කාලය

" සක්‍රිය සේවා කාලය" යනු, ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන් ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේ ය.

සකස් කළේ: අත්සන ..............

පරීක්ෂා කළේ :..............

(විෂයභාර මාණ්ඩලික නිලධාරියා)

එච්. එස්. කොඩිතුවක්කු
සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
(බස්නාහිර පළාත)
ආදිපාද වීදිය, කොළඹ 01

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය : 2019.11.20

අත්සන ..............
(දෙපාර්තමේන්තු ප්‍රධානි)
නම රංජිත් ජී. විජයවික්‍රම
තනතුර සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
නිලමුද්‍රාව සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත) ආදිපාද වීදිය, කොළඹ 01.

යොමු අංකය: 1/9/1/35 (II වෙළුම)

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරි තනතුර සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය : 2019.12.02

අත්සන : ..............
නම : ..............ජේ. එම්. ඒ. පෙරේරා
ලේකම්
..............
සමුපකාර අමාත්‍යාංශය (බ.ප)
කෘෂි, ඉඩම්, වාරිමාර්ග, ධීවර සහ ධීවර සම්පත් සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප.)
නිලමුද්‍රාව
නො.204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල

යොමු අංකය: CSWP/PTR/9-3/EI/1-5

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරි තනතුර සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය : 2019.12.18

අත්සන : ..............
නම : ..............
ප්‍රධාන ලේකම් (බ.ප)
ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් (බස්නාහිර පළාත)
ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)
නිලමුද්‍රාව
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල

ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/4/7/12
දිනය : 2020.06.22

යොමු අංකය: WPC/PSC/MNP/C1/4/81

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරි තනතුර සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පටිපාටිය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

දිනය : 2020-02-26

අත්සන :
නම : තිලක් සෙනරත්
ලේකම් ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

නිලමුද්‍රාව

යොමු අංකය: GOS/ADM/4/7/12

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය 2020.06.22 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි.

දිනය : 2020/06/22

අත්සන : ජී. සෝමසිරි
නම : ආණ්ඩුකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය
10 වන මහල, පළාත් සභා සංකීර්ණය
අංක. 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

නිලමුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/ADM/4/7/12
දිනය : 2020.06.22

18

ඇමුණුම : 01

<u>බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ</u>

<u>සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය</u>

1. පරීක්ෂණයේ නම :
   බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

2. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| **<u>1. අතිරේක සේවා පළපුරුද්ද</u>**<br>බඳවා ගැනීමේ සුදුසුකම සඳහා සලකා බලන වසර 05ට අමතර සමුපකාර සංවර්ධන නිලධාරි I ශ්‍රේණියේ සේවා කාලය වසරකට ලකුණු 06 බැගින් උපරිම වසර 10 සලකා බැලේ.<br>(මාස 06 ක සේවා කාලයක් සපුරා ඇති විටෙක ලකුණු 03ක් ලබා දෙනු ලැබේ) | 60 | ලකුණු ලබා ගැනීමේ කුසලතා අනුපිළිවෙල අනුව උපරිම ලකුණු ලබා ගන්නා අයගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ |
| **<u>2. සේවා නිපුණතාවය</u>**<br>I. සමුපකාර සංවර්ධන නිලධාරියෙකු වශයෙන් වසර 05 ක සේවා කාලය සම්පූර්ණ කල පසු, බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 58 වගන්තිය යටතේ තීරකවරයෙකු /බේරුම්කරුවෙකු ලෙස කටයුතු කර තිබීම (ලකුණු 03)<br><br>II. සමුපකාර සංවර්ධන නිලධාරියෙකු වශයෙන් වසර 05 ක සේවා කාලය සම්පූර්ණ කල පසු, දිස්ත්‍රික් කාර්යාලයක සමුපකාර සංවර්ධන නිලධාරියෙකු ලෙස කටයුතු කරන අවස්ථාවක, විගණන නිලධාරියෙක් වශයෙන් උපරිම වසර 02 ක් කටයුතු කර තිබීම<br>(එක් වසරකට ලකුණු 04 බැගින්)<br><br>හෝ<br><br>සමුපකාර සංවර්ධන නිලධාරියෙකු වශයෙන් වසර 05ක සේවා කාලය සම්පූර්ණ කළ පසු, ප්‍රධාන කාර්යාලයේ සමුපකාර සංවර්ධන නිලධාරියෙකු ලෙස කටයුතු කරනු ලබන නිලධාරියෙකුට වසරකට අවම වශයෙන් විගණන දෙකකට අදාළ ව වසර දෙකක විගණනය සඳහා<br>(එක් විගණනයකට ලකුණු 04 බැගින්)<br>(මුළු ලකුණු ප්‍රමාණය 08)<br><br>III. සමුපකාර සංවර්ධන නිලධාරියෙකු වශයෙන් වසර 05ක සේවා කාලය සම්පූර්ණ කළ පසු, බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 46 සහ 47 වගන්ති යටතේ කරනු ලබන විභාගයක් / විමර්ශනයක්/ පොත්පත් පරීක්ෂාවක් සිදු කර අවසන් කර තිබීම<br>(එක් විභාගයකට/ විමර්ශනයකට/ පොත්පත් | 25 | |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : G0S/ADM/4/7/12
දිනය : 2020.06.22

| | | |
|---|---|---|
| පරීක්ෂාවකට ලකුණු 02 බැගින් අවස්ථා 04 ක් සඳහා) (ලකුණු 08)<br><br>IV. දිස්ත්‍රික් කාර්යාලයක සමුපකාර සංවර්ධන නිලධාරියෙකු වශයෙන් වසර 05ක සේවා කාලය සම්පූර්ණ කළ පසු අවම වශයෙන් එක් සමුපකාර සමිතියක ඇවරකරුවෙකු ලෙස කටයුතු කර ඇවරය අවසන් කර තිබීම . (ලකුණු 06) | | |
| **3.** <u>රහස්‍යතා වාර්තා</u><br>(වාර්ෂික රහස්‍යතා වාර්තා වල පහත දැක්වෙන ක්ෂේත්‍ර පදනම් කරගෙන ලකුණු දෙනු ලැබේ.)<br>(i) චරිතය හා ස්වියත්වය<br>(ii) ප්‍රතිභානය<br>(iii) රාජකාරි ඉටු කිරීම<br>(iv) සමිතිවල විගණන පරීක්ෂණය හා අධීක්ෂණය | 10 | |
| විශිෂ්ඨ අන්දමින් සුදුසුකම් ලැබ ගෙන - ලකුණු 10 | | |
| උසස් සේ සුදුසු ව - ලකුණු 08 | | |
| සුදුසු ව - ලකුණු 05 | | |
| | | |
| **4.** <u>**සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව**</u> | 05 | |
| සන්නිවේදන හැකියාව - ලකුණු 02 | | |
| නායකත්වය - ලකුණු 02 | | |
| පෞරුෂත්වය - ලකුණු 01 | | |
| **මුළු ලකුණු** | **100** | |

3. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධාරියා : පත්කිරීම් බලධාරියා

4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : පුරප්පාඩු ඇති වූ විට

සකස් කළේ : අත්සන : ..........
(විෂයභාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : ඒ. ඒ. ශ්‍රියානි පෙරේරා
තනතුර : ප්‍රධාන කළමනාකරණ සහකාර, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත) ආදිපාද වීදිය, කොළඹ 01.
දිනය : 2019.11.20

පරීක්ෂා කළේ : අත්සන : ..........
(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත) ආදිපාද වීදිය, කොළඹ 01
තනතුර: ..........
දිනය : 2019.11.20

අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : රුවිනි ඒ. විජයවික්‍රම
තනතුර : සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (වැ.බ) සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත) ආදිපාද වීදිය, කොළඹ-01.
දිනය : 2019.11.20

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/4/7/12.
දිනය : 2020.06.22